**ශ්‍රී ලංකා සුමෝ සම්මේලනය - 2019**

**-----------------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1.** **මතය ව්‍යාවනය**

**-------------------**

ශ්‍රී ලංකා සුමෝ සම්මේලනයේ (“සම්මේලනය”) 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සිදුකිරීම සඳහා පොදු පරිචයේ යෙදෙන වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයක් විසින් මට සහාය වන ලදී.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට සුදුසු විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

**1.2.** **මතය ව්‍යාවනය සඳහා පදනම**

**-------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාවනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

**1.3.** **මූල්‍ය ප්රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සම්මේලනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සම්මේලනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සම්මේලනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සම්මේලනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සම්මේලනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය

මාගේ වගකීම වන්නේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන විගණනය කර විගණන වාර්තාවක් නිකුත් කිරීමයි. කෙසේ වෙතත්, මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුනු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතයක් ඉදිරිපත් කිරීම සඳහා ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ විගණන නිරීක්ෂණ

### 1.5.1 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | අයිතමය | වටිනාකම<br>රු. | සාක්ෂි නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ගෙවිය යුතු | 221,000 | ඉන්වොයිසි හා බිල්පත් | සංගමයේ අදහස් දක්වා නොතිබුණි. | ගෙවිය යුතු දෑ තහවුරු කරගැනීම සඳහා ප්‍රමාණවත් ලේඛන විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ජංගම නොවන වත්කම් | 12,156,531 | භෞතික සත්‍යාපන වාර්තා හා ස්ථාවර වත්කම් ලේඛනය | -එම- | වත්කම්වල පැවැත්ම තහවුරු කරගැනීම සඳහා ප්‍රමාණවත් ලේඛන විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 129,479 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 94,987ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 224,466 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ආදායම රු. 1,387,021 කින් අඩුවීම මෙම පිරිහීම සඳහා හේතු වී තිබුණි.